# දරුවන් සම්බන්ධ තොරතුරු හුවමාරු කර ගැනීම
# Child Information Sharing

Sinhalese | සිංහල

## ඔබට මගේ තොරතුරු හුවමාරු කර ගැනීමට අවශ්‍ය වන්නේ ඇයි?

### වික්ටෝරියානු දරුවන් වෙනුවෙන් රැකවරණය

සියලුම වික්ටෝරියානු දරුවන්ට ආරක්ෂිත සහ ප්‍රීතිමත් ජීවිතයක් ගත කිරීමට උපකාර කිරීම සඳහා, වික්ටෝරියානු රජය දරුවන් සමග කටයුතු කරන යම් යම් වෘත්තිකයන් විසින් තොරතුරු හුවමාරු කර ගන්නා ආකාරය වැඩිදියුණු කරමින් සිටියි.

සේවාවන් බොහොමයක් දැනටමත් තොරතුරු හුවමාරු කර ගැනීම සිදු කරයි. ළමා තොරතුරු හුවමාරු කර ගැනීමේ යෝජනා ක්‍රමය (Child Information Sharing Scheme [CISS]) මගින් තමා කටයුතු කරන දරුවන් සම්බන්ධයෙන් සම්පූර්ණ අදහසක් ලබා දීම පහසු කරන අතර, ඔවුන්ට හුවමාරු කර ගත හැක්කේ මොනවාද යන්න මෙන්ම පවුලේ පෞද්ගලිකත්වය ආරක්ෂා කර ගැනීම ගැන අවබෝධයක් ලබා ගැනීමට උපකාර කරයි.

### එමගින් පවුල්වලට උපකාර කරන්නේ කෙසේද?

බොහෝ දරුවන්ට ජීවිතයේ කිසියම් අවස්ථාවක උපකාර අවශ්‍ය වනු ඇත. ළමා තොරතුරු හුවමාරු කර ගැනීමේ ප්‍රතිසංස්කරණ මගින් උපතේ සිට, 18 දක්වා වන දරුවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට වෘත්තිකයන්ගෙන් සහ සංවිධානවලින් වඩා හොඳ සහයෝගයක් ලබා ගැනීමට උපකාරී වේ.

### එය වෘත්තිකයන්ට උපකාරී වන්නේ කෙසේද?

ළමා තොරතුරු හුවමාරු කර ගැනීම මගින් දරුවන්ට සහාය දෙන සහ රැකබලා ගන්නා වෘත්තිකයන්ට (ගුරුවරුන් සහ හෙදියන් වැනි) දරුවෙකු පිළිබඳ සිය දැනුම එකිනෙකා සමග හුවමාරු කර ගැනීමට හැකි වන අතර, එමගින් හුවමාරු කර ගත යුතු දේ සහ පවුලේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරන්නේ කෙසේද යන්න පිළිබඳ මාර්ගෝපදේශ සපයයි.

### උදාහරණ:



ටාජ් පාසල් මාරු කර ඇත. ඔහු පන්තියේදී කතා කිරීමට අකමැති බවත්, ඔහුගේ පාසල් වැඩ නිම කිරීමේ ගැටලුවක් ඇති බවත් ඔහුගේ නව ගුරුවරිය වන මිහිරි දකී. ටාජ්ගේ කලින් පාසලෙන් තොරතුරු ඉල්ලා සිටීමෙන්, ඔහු පන්තියට සහභාගී වීමට පසුබට වන්නේ ඔහු ඩිස්ලෙක්සියා තත්ත්වයෙන් පෙළෙන නිසා බව මිහිරි දැනගනියි.

**මෙය ටාජ්ගේ ඉගෙනුම් අවශ්‍යතා සඳහා උපකාර වන පාඩම් සැලැස්මක් නිර්මාණය කිරීමට ටාජ්ගේ ගුරුවරියට ඉඩ සලසන බැවින්, ළමා තොරතුරු හුවමාරු කර ගැනීම හරහා හුවමාරු කර ගත හැකි තොරතුරු සඳහා උදාහරණයකි.**

# ඔබ හුවමාරු කර ගන්නේ කා සමගද? එය භාවිතා කරනු ඇත්තේ කෙසේද?

## හුවමාරු කරගත් තොරතුරු වර්ගය

දරුවන්ගේ යහපැවැත්ම හෝ ආරක්ෂාව සඳහා උපකාරී වන ඕනෑම තොරතුරක් හුවමාරු කර ගත හැකිය. මෙය දරුවාට ලැබෙන වෘත්තීය සහාය, හෝ පවුල් සබඳතා පිළිබඳ අවබෝධය වැනි තොරතුරු විය හැකිය.

**මෙම තොරතුරු භාවිත කරන්නේ කුමක් සඳහාද?**

**ඔබේ කතාව දෙවරක් පැවසීමට අවශ්‍ය නොවන බවට වග බලා ගැනීමට**

**උපකාර කළ හැකි නිවැරදි පුද්ගලයන් සම්බන්ධ කර ගැනීමට**

**සමස්ත පින්තූරය දැකීමට**

**දරුවන්ගේ දියුණුවට උපකාර කිරීමට**

## තොරතුරු හුවමාරු කර ගැනීමට සහ ප්‍රවේශ විය හැක්කේ කාටද?

තොරතුරු හුවමාරු කර ගැනීමේ අධිකාරිය පවතින්නේ යම් යම් පුද්ගලයන් සඳහා පමණි - සියලු දෙනාටම නොවේ. මෙම පුද්ගලයින් ගුරුවරුන්, වෛද්‍යවරුන්, සමාජ වැඩ වෘත්තිකයන් සහ උපදේශකයින්, හෙදියන් සහ පොලිසිය වැනි දරුවන් රැකබලා ගැනීමට සහ ආරක්ෂා කිරීමට බැඳී සිටින වෘත්තිකයන් වේ.



## උදාහරණ:

ලීසා පාසල් හෙදියක් වන අතර ඇය ඇලිස් සමඟ වැඩ කරයි, ඇගේ පස් හැවිරිදි දියණිය ජැස්මින් සුළු හෘදයාබාධයකින් පෙළෙයි. ජැස්මින් ප්‍රාථමික පාසලට යාම ආරම්භ කිරීමත් සමඟ, ලීසා ඇලිස් සමඟ කතා කරන අතර, ඇගේ අවශ්‍යතා පිළිබඳව ඔවුන් දැනුවත් බව සහතික කිරීම සඳහා, ජැස්මින්ගේ තත්ත්වය පිළිබඳ තොරතුරු ඇගේ ප්‍රාථමික පාසලේ හෙදිය සමග බෙදා ගැනීම පිළිබඳ ඇගේ අදහස් විමසයි. තොරතුරු බෙදා ගැනීමට පෙර ඇලිස්ගේ අදහස් ගැන ලීසා දැන සිටියි.

**වෘත්තිකයෙකුට තොරතුරු හුවමාරු කර තෝරා ගත හැකි අවස්ථා සහ ඔවුන්ට එය බෙදාගත හැක්කේ කා සමග ද යන්න සඳහා මෙය උදාහරණයක් සේ දැක්විය හැකිය.**

# තොරතුරු හුමාරු කර ගත හැක්කේ කුමන අවස්ථාවලද?

## පහත දැක්වෙන අවස්ථාවල දී හැර තොරතුරු බෙදා ගත නොහැක:

1. එය දරුවාගේ (හෝ ළමුන්ගේ කණ්ඩායමේ) යහපැවැත්ම හෝ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමට භාවිතා කරන අවස්ථාවල.
2. දරුවන්ට සේවා සැපයීම, සැලසුම් සැකසීම හෝ විමර්ශනය කිරීම හෝ කළමනාකරණය කිරීම සඳහා හුවමාරු කර ගැනීම සහාය වන අවස්ථාවල.
3. එය කිසිවකුට අනතුරක් නොවන හා, නීත්‍යානුකූලව තහනම් හෝ රෙගුලාසි යටතේ බැහැර නොකරන අවස්ථාවල.

තොරතුරු බෙදා ගැනීමට පෙර සපුරාලිය යුතු සම්පූර්ණ කොන්දේසි ලැයිස්තුව සඳහා, www.infosharing.vic.gov.au වෙත පිවිසෙන්න.

## තොරතුරු හුවමාරු කර ගැනීම සිදු වන්නේ කෙසේද?

නීත්‍යානුකූලව බලයලත් සංවිධාන සහ වෘත්තිකයන්ට තොරතුරු ඉල්ලා සිටීමට හෝ හුවමාරු කර ගැනීමට තීරණය කිරීමට හැකිය.

## තොරතුරු පුද්ගලිකව සහ ආරක්ෂිතව තබා ගැනීම

දරුවන්ගේ තොරතුරු ආරක්ෂිතව සහ අනතුරුදායක නැතුව තබා ගැනීම, සහතික කිරීම දරුවන් ආරක්ෂා කර ගැනීමේ කොටසක් වේ. ළමා තොරතුරු හුවමාරු කර ගැනීම මගින් වෘත්තිකයන්ට තොරතුරු හුවමාරු කර ගත හැක්කේ කවර අවස්ථාවල දැයි දැන්වීමෙන් පවතින රහස්‍යතා නීතිවලට සහාය දක්වයි. අවශ්‍ය නොවන අවස්ථාවල දී රහස්‍ය තොරතුරු හුවමාරු කර ගැනීම වරදකි. ඊට අමතරව, සියලුම තොරතුරු තනි සංවිධාන විසින් ආරක්ෂිතව ගබඩා කළ යුතුය. බලය ලත් කාර්යමණ්ඩලවලට සිය වගකීම් පිළිබඳව දැනුවත් වියහැකි සේ පුහුණුව සැපයෙනු ඇත.

## උදාහරණ:

ඇන්ඩි, ලී සම්බන්ධයෙන් තොරතුරු බෙදා ගැනීමට උසස් පාසලක ඇතුළත් කිරීමේ නිලධාරියාගෙන් ඉල්ලීමක් ලබන සමාජ උපකාර වෘත්තිකයෙකි. ලී ගේ පවුල තාවකාලිව හිසට සෙවණක් නොමැතිව සිටින විට ඇන්ඩි ඔවුන්ට උපකාර කර ඇත. ලී හා ඔහුගේ පවුලේ අය සමග කතා කිරීමෙන් අනතුරුව, ඔවුන්ගේ ජීවන තත්ත්වය ගැන තොරතුරු හුවමාරු කර නොගැනීමට ඇන්ඩි තීරණය කරන්නේ එය ලීව පාසලේ ලියාපදිංචි වීමෙන් බැහැර කිරීමට හේතුවක් විය හැකි බැවිනි.

**මෙය වෘත්තිකයන්ට තොරතුරු හුවමාරු කර ගැනීමට නොහැකි අවස්ථාවක් පිළිබඳ උදාහරණයකි - ඇතුළත් කිරීමේ නිලධාරියා බලයලත් වෘත්තිකයෙකු නොවන අතර, ලී හෝ ඔහුගේ පවුලේ අයගේ යහපැවැත්ම හෝ ආරක්ෂාව සඳහා සහය දැක්වීම සඳහා තොරතුරු භාවිතා නොකෙරේ.**

# පැමිණිලි

## අවසර දිය නොහැකි ආකාරයකට තොරතුරු හුවමාරු කර ගැනීම සිදුවී ඇති බවට ඔබට ගැටලු ඇත්නම්, ඒ සම්බන්ධයෙන් ප්‍රකාශ කිරීමට හෝ පැමිණිල්ලක් කිරීමට ඔබට අයිතිය ඇත.

**පළමු අවස්ථාවේම පැමිණිල්ලක් සිදු කිරීම සඳහා තොරතුරු හුවමාරුකර ගත් සංවිධානය සමග කතා කරන්න. පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාකිරීම ගැන සියලු ආයතනවලට ක්‍රියාපටිපාටි පැවතිය යුතුය.**



## ඔබේ ගැටලුව විසඳා ඇති ආකාරය ගැන ඔබ සෑහීමකට පත් නොවේ නම්, පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකිය:

**පෞද්ගලික තොරතුරු පිළිබඳ පැමිණිල්ලක් නම් වික්ටෝරියානු තොරතුරු කොමසාරිස් කාර්යාලය**

වෙබ් අඩවිය: ovic.vic.gov.au / දුරකථන: 1300 666 444

**සෞඛ්‍ය තොරතුරු සම්බන්ධ පැමිණිල්ලක් නම් සෞඛ්‍ය පැමිණිලි කොමසාරිස්**

වෙබ් අඩවිය: hcc.vic.gov.au / දුරකථන: 1300 582 113

## ඔබට ළමා තොරතුරු හුවමාරු කර ගැනීමේ යෝජනා ක්‍රමය පිළිබඳ වැඩි විස්තර අවශ්‍ය නම්:

**අප අමතන්න:** 1800 549 646

**අපට ලියන්න:** CISandFVIS@education.vic.gov.au

**වෙබ් අඩවියට යන්න:** vic.gov.au/child-information-sharing-scheme

CHILD INFORMATION SHARING SCHEME

VICTORIA State Government